# ශුද්ධියට මඟ අහුරන විකෘතිය

**විපල්ලාසයට බලපාන කරුණු හා විපල්ලාස ඇති විය හැකි ආකාරය පිළිබඳ කෙරෙන විමසීමකි.**

---

17 අගෝස්තු, 2019

0

***ආචාර්ය දිල්ශාන් මනෝජ් රාජපක්ෂ***

මෙම ලිපිය සිළුමිණ පුවත්පතෙහි සියපත කොටසෙහි පි. 28 හි පළ වූවකි.

විශේෂාංග



**යථාර්ථය පිළිබඳ කිසියම් සංකල්පනාවක්හෝ මතයක් හෝ කරුණක් හෝ සම්බන්ධයෙන් විරුද්ධ පාර්ශ්වය ගැනීම (හෝ දැරීම)විපර්යාසයි. අනිත්‍ය දෑ නිත්‍ය ලෙස ගැනීම, දුක් සහගත දෑ සුඛ සහගත ලෙසගැනීම, අනාත්ම දෙය ආත්ම ලෙස ගැනීම හා අසුභ වූ දෙය සුභ ලෙස ගැනීම යනාදී ලෙස එන**

**විපර්යාස ප්‍රත්‍යක්ෂය (සංඥා) ද මනස හෙවත් සිතිවිලි (චිත්ත) ද මතවාද (දෘෂ්ටි) ද පදනම් කරගෙන ක්‍රියාත්මක වේ.**

**අනිත්‍ය, දුක්ඛ, අනාත්ම හාඅසුභ යනාදිය අයත් වන්නේ ලෝක යථාර්ථය නිරූපණය කරන ප්‍රඥා සම්පත්තිය සඳහා දායක වන ධනාත්මක අංශයට ය. එමෙන් ම එහි ප්‍රතිවිරුද්ධ අංශය වන නිත්‍ය, සුඛ, ආත්ම හා සුභ යනාදිය අයත් වන්නේ විපර්යාස සහගතභාවය නිරූපණය කරන ඍණාත්මක අංශයනියෝජනය කරන පෘථග්ජන පුද්ගලයා තුළ ඇති වන්නා වූ විශුද්ධියට හෙවත්විශුද්ධියට බාධා පමුණුවන්නකි. විපල්ලාස යනු විකෘති ස්වභාවය යි.**

විපල්ලාස සඳහා මුල් වන කරුණු දෙකකි.

1 අවිද්‍යාව 2 තණ්හාව

දිට්ඨි විපල්ලාස යනු දෘෂ්ටිය මුල් කරගත් විපල්ලාස යි. අනිත්‍ය දෙය නිත්‍ය ලෙස ගැනීම හා අනාත්ම දෙය ආත්ම ලෙස ගැනීම යි. තණ්හා විපල්ලාස යනු තණ්හාව මුල් කරගත් විපල්ලාස යි. අසුභයෙහි සුභතාව දැකීම හා දුක්ඛයෙහි සුඛය ගැනීම නිසා තණ්හා විපල්ලාස ඇති වේ. තණ්හාවෙන් තොර දෘෂ්ටියක් නැත. එබැවින් අවිද්‍යාව හා තණ්හාව අතර මූලික සබඳතා පවතී. මෙහි ඇති විශේෂත්වය වන්නේ දිට්ඨි විපල්ලාස අතීතය පදනම් කරගෙන ඇති වන අතර අනාගතය සම්බන්ධයෙන් තණ්හා විපල්ලාස ඇති වන බව නෙත්තිප්පකරණට්ඨ කථාවේ දී පෙන්වා දීම යි.

ඒ අනුව බ්‍රහ්මජාල සූත්‍රයේ අන්තර්ගත දෙසැටක් මිථ්‍යා දෘෂ්ටීන්ගෙන් පූර්වාන්ත කල්පික මතවාද අටළොස අවිද්‍යාව පදනම් කරගත් විපල්ලාස වන අතර එහි ඇති අපරාන්ත කල්පික මතවාද සතළිස් සතර තණ්හා විපල්ලාස පදනම් කරගත් විපල්ලාස ලෙස හුවා දැක්වා තිබීම යි. මේ අනුව සසර පැවැත්මට හේතු වන්නේ අවිද්‍යා හා තණ්හා විපල්ලාස යි.

එක් අතෙකින් අවිද්‍යාව නිසා විපල්ලාස උපදින බව ඉහත දී සාකච්ඡා කෙරිණ. එසේ ම අනෙත් අතින් විපල්ලාස නිසා අවිද්‍යාව උපදින බව මහානිද්දේසට්ඨ කථාව පෙන්වා දෙයි. එලෙස අවිද්‍යාව උපදින්නේ ඕඝයක් ලෙසිනි. මිථ්‍යා දෘෂ්ටිය යනු විපරීත දැකුම් ඇත්තා ය. (මිච්ඡා දිට්ඨීකොති විපරිත දස්සනා)

සංසාරය නැමැති සැඩ පහර තරණය කරමින් නිර්වාණගාමී මාර්ගයේ ගමන් කිරීම ‘තිත්ථං’ යනුවෙන් සඳහන් වේ. මෙම මාර්ගයට ප්‍රතිපක්ෂ මාර්ගය දෘෂ්ටි ගතික, දෘෂ්ටි තීර්ථය යි. තීර්ථක, නග්න, නිගන්ථශ්‍රමණ පිරිස් ද කථ කලාපාදි ශ්‍රමණයන්, පොක්ඛරසාති පරිබ්‍රාජක පිරිස් ද ආත්මය හා ලෝකය ශාස්වත යැයි දක්වමින් විපරීතතා ගෙනහැර දක්වන බව නානාතිත්ථිය සූත්‍ර වර්ණනාවේ සඳහන් වේ.

විපල්ලාස විශ්ලේෂණය හා වර්ගීකරණය

අනිත්‍ය, දුක්ඛ, අනාත්ම හා අසුභ යන සිව් වැදෑරුම් ධර්ම කරුණුවල ප්‍රතිවිරුද්ධ පාර්ශ්වය ගැනීම විපල්ලාස වන අතර එම සිව් වැදෑරුම් ධර්ම කෙරෙහි යොමු වීම විපල්ලාසග්‍රාහී වීමට හේතුව බව බුදුසමයේ මූලික අවධාරණය යි. විපල්ලාස පහක් නැත. ඇත්තේ සතරක් පමණි. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම හා අසුභ යන සිව් වැදෑරුම් ධර්ම කරුණුවල ප්‍රතිවිරුද්ධ පාර්ශ්වය ගැනීම විපල්ලාස වන අයුරු අංගුත්තර නිකායේ විපල්ලාස සූත්‍රයේ සඳහන් වේ. සමස්තයක් ලෙස අනිත්‍ය, දුක්ඛ, අනාත්ම හා අසුභ යන සිව් වැදෑරුම් කරුණු පදනම් කරගෙන දොළොස් වැදෑරුම් විපල්ලාස එමඟින් හඳුනාගත හැකි ය.

1.අනිත්‍ය දෙය නිත්‍ය ලෙස ගැනීමෙන්

ඇති කරගන්නා විපල්ලාස

I. අනිත්‍ය දෙය නිත්‍ය ලෙස ගැනීමෙන් ඇති කරගන්නා සඤ්ඤා විපල්ලාස

II. අනිත්‍ය දෙය නිත්‍ය ලෙස ගැනීමෙන් ඇති කරගන්නා චිත්ත විපල්ලාස

III. අනිත්‍ය දෙය නිත්‍ය ලෙස ගැනීමෙන් ඇති කරගන්නා දිට්ඨි විපල්ලාස

2. දුක්ඛ දෙය සුඛ ලෙස ගැනීමෙන්

ඇති කරගන්නා විපල්ලාස

I. දුක්ඛ දෙය සුඛ ලෙස ගැනීමෙන් ඇති කරගන්නා සඤ්ඤා විපල්ලාස

II. දුක්ඛ දෙය සුඛ ලෙස ගැනීමෙන් ඇති කරගන්නා චිත්ත විපල්ලාස

III. දුක්ඛ දෙය සුඛ ලෙස ගැනීමෙන් ඇති කරගන්නා දිට්ඨි විපල්ලාස

3. අනාත්ම දෙය ආත්ම ලෙස ගැනීමෙන්

ඇති කරගන්නා විපල්ලාස

I. අනාත්ම දෙය ආත්ම ලෙස ගැනීමෙන් ඇති කරගන්නා සඤ්ඤා විපල්ලාස

II. අනාත්ම දෙය ආත්ම ලෙස ගැනීමෙන් ඇති කරගන්නා චිත්ත විපල්ලාස

III. අනාත්ම දෙය ආත්ම ලෙස ගැනීමෙන් ඇති කරගන්නා දිට්ඨි විපල්ලාස

4. අසුභ දෙය සුභ ලෙස ගැනීමෙන්

ඇති කරගන්නා විපල්ලාස

I. අසුභ දෙය සුභ ලෙස ගැනීමෙන් ඇති කරගන්නා සඤ්ඤා විපල්ලාස

II. අසුභ දෙය සුභ ලෙස ගැනීමෙන් ඇති කගන්නා චිත්ත විපල්ලාස

III. අසුභ දෙය සුභ ලෙස ගැනීමෙන් ඇති කරගන්නා දිට්ඨි විපල්ලාස

විපල්ලාස ඇති නො වීම හෙවත් අවිපර්යාස්තයෙහි දී ද උක්ත කී විපල්ලාස ප්‍රභේදවල ප්‍රතිපක්ෂය ද සිව් වැදෑරුම් ව සමස්තයක් ලෙස දොළොස් වැදෑරුම් ව දැක්වේ.

1.නිත්‍ය දෙය අනිත්‍ය ලෙස ගැනීමෙන්

ඇති කරගන්නා අවිපල්ලත්ථ

I. නිත්‍ය දෙය අනිත්‍ය ලෙස ගැනීමෙන් ඇති කරගන්නා සඤ්ඤා අවිපල්ලත්ථ

II. නිත්‍ය දෙය අනිත්‍ය ලෙස ගැනීමෙන් ඇති කරගන්නා චිත්ත අවිපල්ලත්ථ

III. නිත්‍ය දෙය අනිත්‍ය ලෙස ගැනීමෙන් ඇති කරගන්නා දිට්ඨි අවිපල්ලත්ථ

2.සුඛ දෙය දුක්ඛ ලෙස ගැනීමෙන්

ඇති කරගන්නා අවිපල්ලත්ථ

I. සුඛ දෙය දුක්ඛ ලෙස ගැනීමෙන් ඇති කරගන්නා සඤ්ඤා අවිපල්ලත්ථ

II. සුඛ දෙය දුක්ඛ ලෙස ගැනීමෙන් ඇති කරගන්නා චිත්ත අවිපල්ලත්ථ

III. සුඛ දෙය දුක්ඛ ලෙස ගැනීමෙන් ඇති කරගන්නා දිට්ඨි අවිපල්ලත්

3. ආත්ම දෙය අනාත්ම ලෙස ගැනීමෙන්

ඇති කරගන්නා අවිපල්ලත්ථ

I. ආත්ම දෙය අනාත්ම ලෙස ගැනීමෙන් ඇති කරගන්නා සඤ්ඤා අවිපල්ලත්ථ

II. ආත්ම දෙය අනාත්ම ලෙස ගැනීමෙන් ඇති කරගන්නා චිත්ත අවිපල්ලත්ථ

III. ආත්ම දෙය අනාත්ම ලෙස ගැනීමෙන් ඇති කරගන්නා දිට්ඨි අවිපල්ලත්ථ

4. සුභ දෙය අසුභ ලෙස ගැනීමෙන්

ඇති කරගන්නා අවිපල්ලත්ථ

I. සුභ දෙය අසුභ ලෙස ගැනීමෙන් ඇති කරගන්නා සඤ්ඤා අවිපල්ලත්ථ

II. සුභ දෙය අසුභ ලෙස ගැනීමෙන් ඇති කරගන්නා චිත්ත අවිපල්ලත්ථ

III. සුභ දෙය අසුභ ලෙස ගැනීමෙන් ඇති කරගන්නා දිට්ඨි අවිපල්ලත්ථ

අනිත්‍ය වස්තුවෙහි නිත්‍ය සංඥා ඇති දුක්ඛයෙහි සුඛ සංඥා ඇති අනාත්මයෙහි ආත්මය යැයි සංඥා ඇති අශුභයෙහි ශුභ සංඥා ඇති ව දෘෂ්ටි විපර්යාස වශයෙන් මිථ්‍යා දෘෂ්ටියට වැටුණු වික්ෂිප්ත සිත් ඇති සත්ත්වයා යෝගක්ෂේමය නො ලද හෙයින් මාරයාගේ යෝගයෙහි යුක්ත වන බව බෞද්ධ අදහස යි. එම සත්ත්වයෝ ජාති, ජරා, මරණ ආදිය කරා යන බවත් සංසාරගාමී වන බවත් දක්වා ඇත. (අංගුත්තරනිකාය 2, චතුක්ක-නිපාතපාළි, විපල්ලාස සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍ය-ස්ථානය, දෙහිවල, 1962, පි. 100-102)

එබැවින් ලොව පහළ වන බුදුවරු දුක් සන්සිඳවන සිව්සස් දහම් දෙසති. ඒ මඟින් නැණ එළිය කරන චතුරාර්ය සත්‍ය පහළ වන අතර ප්‍රාඥයෝ එම බුදුවරුන්ගෙන් දහම් අසා ස්වකීයීය චිත්තය පිරිසුදු කරගෙන අනිත්‍ය අනිත්‍ය වශයෙන් දුක් දුක් වශයෙන් අනාත්මය අනාත්මය වශයෙන් අශුභය අශුභය වශයෙන් දැක සම්‍යග් දර්ශනය වෙත පැමිණ සියලු සසර දුක් ඉක්මවති. මේ අනුව සියලු දුක්වලට මූල හේතුව විපර්යාස බවත් එය පුද්ගලයා දෘෂ්ටිගාමී කරවීමටත් අවසානයේ සංසාරගාමී වීමටත් බලපායි. එසේ ම එමඟින් පැනෙන මූලික අදහසක් වන්නේ බුදුවරු ලොව පහළ වන්නේ විපර්යාස දුරු කොට ලොවට ඥානාලෝකය දායාද කිරීමට යි.

විපල්ලාස සිදු වන ආකාරය අනුව තවත් ආකාරයකින් විපල්ලාස වර්ග දෙකක් හඳුනාගත හැකි ය. එනම්,

I. ලෝකය දෙස බලා පුද්ගලයා තුළ ඇති වන විපල්ලාස

II. පුද්ගලයාගෙන් තොර ව ස්වභාවික ලෝකයේ ඇති වන විපල්ලාස

මෙහි දෙවැනි ව දැක්වූ විපල්ලාස ප්‍රභේදය සත්‍ය ලෝකය තුළ වස්තූන්ගේ ඇති වන විකෘතිතාව අදහස් කරන අතර එම විකෘතිතාව ඍණාත්මකවත්, ධනාත්මකවකවත් සාකච්ඡා කළ හැකි ය. ඍණාත්මක ව සත්‍ය ලෝකය තුළ වස්තූන්ගේ ඇති වන විකෘතිතාවයට නිදසුන් ලෙස ගසක ඵලයක් නරක් වීම, සත්ත්ව මෘත දේහයක පණුවන් හටගැනීම ආදිය යි. ධනාත්මක ව සත්‍ය ලෝකය තුළ වස්තූන්ගේ ඇති වන විකෘතිතාවට නිදසුන් ලෙස එක්වර ම පොළොවෙන් මැණික් පහළ වීම, මහමුහුදේ විශාල ගොඩ බිම් පහළ වීම ආදිය දැක්විය හැකි ය.

කෙසේවෙතත් විපල්ලාසවල එවැනි ඍණාත්මකවත්, ධනාත්මකවකවත් පදනම් සාකච්ඡා කිරීම කොතෙක් දුරට සාර්ථක හා සාධාරණ වන්නේදැයි යන්න දාර්ශනික ව ගැටලු සහගත වන අතර මෙයට ප්‍රධාන හේතු-වක් වන්නේ පෞද්ගලික හැඟීම් මත ඍණාත්මක ව හා ධනාත්මක ව විපල්ලාස හඳුනාගැනීම වාස්තවික වශයෙන් සාමාන්‍යකරණය කිරීමේ ගැටලුව මෙහි දී පැනනැඟෙන මූලික ගැටලුව යි. එසේ ම විපල්ලාසවල එවැනි ඍණාත්මකවත්, ධනාත්මකවත් පදනම් එකිනෙකට සාපේක්ෂක වීමත් මෙහි දී දාර්ශනික වශයෙන් ගැටලු උත්පාදනය කරයි. කෙසේවෙතත් මෙහි දී අදහස් කරන්නේ ස්වභාවික වශයෙන් ඇති වන පාරිසරික වෙනස් වීම් ය.

ලෝකය තුළ වාසය කරන පුද්ගලයා තුළ විපල්ලාස හටගන්නා අයුරු පිළිබඳ බුදුසමය තුළ වැඩි අවධානයක් යොමු වී ඇත. එයට හේතුව වන්නේ විපල්ලාස ඇති වන්නා වූ පුද්ගලයාට මෙලොව, පරලොව වශයෙන් බලවත් ගැටලුවලට මුහුණපාන්නට සිදු වීම යි. මෙම පදනම අනුව බුදුසමය විපල්ලාස පුද්ගලයාට බලපාන ආකාරය ත්‍රිවිධාකාර ව ගෙන විග්‍රහ කරයි.

I. පුද්ගලයා විෂය ලෝකය හඳුනාගන්නා ආකාරය අනුව විපල්ලාස හටගැනීම (සඤ්ඤා විපල්ලාස) - මෙය සංජානනය ආශ්‍රිත විපල්ලාස යි.

II. පුද්ගලයා විෂය ලෝකය පිළබඳ සිතන ආකාරය අනුව විපල්ලාස හටගැනීම (චිත්ත විපල්ලාස) - මෙය සංවේදනය ආශ්‍රිත විපල්ලාස.

III. පුද්ගලයාගේ අදහස්, මතවාද පදනම් කරගෙන විපල්ලාස හටගැනීම (දිට්ඨි විපල්ලාස) - මෙය චින්තනය ආශ්‍රිත විපල්ලාස

උක්ත කී ත්‍රිවිධාකාර විපල්ලාස පුද්ගලයාට බලපෑම් කරන ආකාරය හෙවත් විකෘතිතා පුද්ගලයා තුළ ඇති වන ආකාර සතරකි.

1 අනිත්‍ය දෙය නිත්‍ය ලෙස ගැනීම

2 දුක් සහගත දේ සුඛ ලෙස ගැනීම

3 අනාත්ම දෙය ආත්ම ලෙස ගැනීම

4 අසුභ දෙය සුභ ලෙස ගැනීම

නිවන් සාක්ෂාත් කරගැනීමෙන් සසර දුක් අවසන් කළ හැකි වන්නේ ක්ලේෂ දුරුකිරීමෙනි. ක්ලේෂ බාහිර ලෝකය තුළ ප්‍රදර්ශනය වන්නේ විපර්යාස මඟිනි.